NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය පැය - 01

### 03 - බහු සංස්කෘතික සමාජය

- 01 - 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01) ''දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත් විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත් වන පුද්ගලයකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු, ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතියයි'' යන සංස්කෘතිය පිළිබඳ නිවචනය ඉදිරිපත් කරන ලද්දේ,

1) චාර්ල්ස් ඒ. එල්වුඩ්  2) ටී. බී. ටයිලර්
3) ඒ. ටී. හිට්ලර්  4) ඒබ්‍රහම් ලින්කන්

02) පහත සිදුවීම් අතුරින් ආක්‍රමණයක් වන්නේ කුමක්ද?

1) බටහිර යුරෝපා ජාතීන්ගේ පැමිණීම.
2) විජය ඇතුලු පිරිස පැමිණීම.
3) මිහිඳු මහ රහතන් වහන්සේ පැමිණීම.
4) පඩුවස්දෙව් ඇතුලු පිරිස පැමිණීම.

03) යහපාලනයක මූලික ගුණාංගයක් නොවන්නේ කුමක්ද?

1) මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.  2) නිදහස හා සාධාරණත්වය.
3) අයිතිවාසිකම්ක තහවුරු නොකිරීම.  4) සම්පත් කාර්යක්ෂමව භාවිතයට ගැනීම

04) සමාජ හා සංස්කෘතික ගුණාංගයක් වන්නේ,

1) සාධාරණ හා නිදහස් මැතිවරණ පැවැත්වීම.
2) යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
3) කැමති ප්‍රදේශයක පදිංචි වීම.
4) වෘත්තීය සමිති පිහිටුවා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

05) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලබාගත හැකි කරුණක් වන්නේ,

1) මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදයට බලපෑම් එල්ල වීම.
2) ගැටුම් උග්‍ර වීම.
3) අන්‍ය ආගම් හා සංස්කෘතීන්ට නිගරු වන ආකාරයට හැසිරීම.
4) එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වීම.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

**02) ප්‍රශ්න අංක 06 සිට 15 දක්වා කෙටි පිළිතුරු සපයන්න.**

06) සංස්කෘතියට අයත් ලක්ෂණ දෙකක් ලියන්න.

07) බහුසංස්කෘතික සමාජයකන මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

08) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ජනවර්ග දෙකක් නම් කරන්න.

09) ඉස්ලාම් ආගමට අයත් සිරිත් විරිත් දෙකක් ලියන්න.

10) බෞද්ධ ආගමට අයත් සිරිත් විරිත් දෙකක් ලියන්න.

11) දෙමළ ජනතාව අදහන ආගම් දෙකක් ලියන්න.

12) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

13) වෙළඳාම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ජාතීන් දෙකක් නම් කරන්න.

14) සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතු දෙකක් ලියන්න.

15) යහපාලනයක මූලික ගුණාංග දෙකක් ලියන්න.

03) පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1) සංස්කෘතිය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචනයක් ලියා දක්වන්න.

2) සංස්කෘතියට අයත් ලක්ෂණ හතරක් ලියන්න.

3) පහත දැක්වෙන ජනවර්ග හා බැඳුණු විවිධ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් සඳහා උදාහරණ දක්වන්න.

- බෞද්ධ සිරිත් විරිත් හා සම්ප්‍රදායන්
- හින්දු සිරිත් විරිත් හා සම්ප්‍රදායන්
- ක්‍රිස්තියානි සිරිත් විරිත් හා සම්ප්‍රදායන්

04) 1) බහු සංස්කෘතික සමාජයක් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

2) ලංකාව බහු සංස්කෘත සමාජයක් වීම කෙරෙහි බලපෑ සාධක හතරක් ලියන්න.

3) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

05) 1) යහපාලනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

2) යහපාලනය බිඳ වැටීමට බලපාන හේතු හතරක් ලියන්න.

3) යහපාලන ගුණාංග තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

06) 1) අපේ රටේ ජනයා භාවිතා කරන ප්‍රධාන භාෂාවන් (විශේෂයෙන් සිංහල ජනතාව දෙමළ භාෂාවත්, දෙමළ ජනතාව සිංහල භාෂාවත්) ඉගෙන ගැනීම වැදගත්වන්නේ ඇයි? කරුණු තුනක් ඉදිරිපත් කරන්න.

2) බහු සංස්කෘතික සමාජයකන ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලබාගත හැකි වාසිදායක තත්ත්වයන් හතරක් සඳහන් කරන්න.

3) බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk